කොට්කාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව
කොළඹ දිස්ත්‍රික්කය

---------------------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මැයි **05** දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 01 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජුලි 29 දින සභාවේ සභාපතිවරයා වෙත යවා ඇත.

1.2 අහිතකර මතය
-----------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වල වැදගත් බව හේතුවෙන් 2015 දෙසැම්බර් 31 දිනට කොට්කාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිඹිබු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාව සතු සියළුම ඉඩම් සහ ගොඩනැගිලි වල වටිනාකම ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මිලදීගත් රු.3,719,075 ක් වටිනා ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඇ) 2013 වර්ෂයේදී බස්නාහිර පළාත් සභාවෙන්, සභාවට ලැබුනු රු.3,178,457 ක් වූ කැබ් රථයේ වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ මිලදී ගත් පුස්තකාල පොත් වල වටිනාකම වූ රු.2,140,900 ක් ගිණුම්ගත කිරීමේදී රු.74,365,309 ක් ලෙස දැක්වීම හේතුවෙන් ස්ථාවර වත්කම් රු.72,224,409 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී පරිත්‍යාග වශයෙන් ලද මෝටර් රථ 07 ක වටිනාකම වූ රු.37,473,920 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඊ) ඉකුත් වර්ෂ වලට අදාළව පොදු ගබඩා සහ විදුලි ගබඩා සඳහා ණය පදනම මත භාණ්ඩ මිළදී ගැනීම් පිළිවෙලින් රු.57,086,904 ක් සහ රු.4,706,140 ක් සමුච්චිත අරමුදලට බැර කිරීම හේතුවෙන් එම ගිණුම රු.61,793,047 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂය සඳහා පළාත් සභාවෙන් හා විමධ්‍යගත අරමුදලින් ලැබිය යුතු මූලාධාර මුදල රු.26,939,142 ක් වුවත් එය රු.27,494,857 ක් ලෙස ගිණුම් තැබීම හේතුවෙන් වර්ෂයේ ආදායම රු.555,715 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඌ) වරිපනම් සඳහා දුන් වට්ටම් රු.1,366,073 ක් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත නොකිරීම හේතුවෙන් වර්ෂයේ වියදම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(එ) 2015 වර්ෂයේදී 2014 වර්ෂය වෙනුවෙන් ලද ආදායම් ආධාර වල එකතුව රු.8,728,222 ක් වුවත් එය රු.3,622,315 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම රු.5,105,907 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂය අවසානයට රු.44,095,145 ක් වූ ණය හිමි වෙන් කිරීම්, විවිධ ණයහිමි ගිණුමට පමණක් ගැලපීම නිසා විදුලිය ණය හිමි රු.2,298,407 කින් ද පොදු සැලසුම් ණයහිමි රු.41,796,738 කින් ද අඩුවෙන් බැර කර තිබුණි.

(ඔ) 2015 දෙසැම්බර් 31 දිනට ණයහිමි ලේඛණයට අනුව ශේෂය රු.45,529,453 ක් වුවද ණයහිමි ගිණුමේ රු.44,095,145 ක් ලෙස දැක්වීම හේතුවෙන් රු.1,434,308 කින් ණයහිමියන් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි.

(ඕ) 2010 වර්ෂයේ සිට නාගරික සංවර්ධන අධිකාරි තැන්පතු ලෙස ලේඛණයේ සටහන් කරන ලද රු.1,257,302 ක මුදල නාගරික සංවර්ධන අධිකාරි තැන්පතු ආයෝජන ගිණුමට ගෙන නොතිබුණි.

(ඖ) සමාලෝචිත වර්ෂය අවසානයට පැවති රු.16,992,433 ක් වූ දේශීය ණය හා සංවර්ධන අරමුදලේ ණය ශේෂය ගිණුම් වල දක්වා නොතිබුණි.

(ක) ඇප තැන්පතු ඉතිරි කිරීම් ගිණුමේ පොළිය වූ රු.6,323 ක් සේවක ඇප ගිණුමට හා සේවක ඇප තැන්පතු ආයෝජන ගිණුමට ගෙන නොතිබුණි.

(ග) 2015 දෙසැම්බර් 31 දින තෙක් සභාවට පළාත් පාලන අමාත්‍යාංශයෙන් හා අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියෙන් පරිත්‍යාග වශයෙන් ලැබී තිබූ වාහන 04 ක වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

(ම) සභාවේ සියළුම ලැබීම් ගෙවීම් සාරාංශ මුදල් පොතේ සටහන් කර තුලනය කර නොතිබුණු අතරඋපකාර්යාලයෙන් සෘජුවම ප්‍රධාන කාර්යාලයේ බැංකු ගිණුමට මාරු කර ලබා ගන්නා මුදල් සාරාංශ මුදල් පොතේ සටහන් කර නොතිබුණි.

1.3.2 නොසැසදෙන පාලන ගිණුම්

-------------------------------

විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් විෂයයන් 09 ක ශේෂයන්වල ගිණුම් අනුව හා උපයෝගී පොත් / උපලේඛණ වල දැක්වෙන ශේෂයන් අතර රු.111,198,049 ක වෙනස්කම් නිරීක්ෂණය විය.

1.3.3 නිරවුල් නොකරන ලද ගිණුම්

-------------------------------

ඉකුත් වර්ෂයන්හි විගණන වාර්තාවලින් ද පෙන්වා දී තිබුණු රු.714,014 ක් වූ ගිණුම් ශේෂ වර්ෂ ගණනාවක සිට නිරවුල් නොකර ඉදිරියට ගෙන එමින් තිබුණි.

**1.3.**4 විගණනය සඳහා සාක්ෂි නොවීම

-----------------------------------

**(i)** එකතුව රු.282,981,606 ක් වූ ගිණුම් විෂයයන් 14 කට අදාළ ව ලිඛිත සාක්ෂි නොමැතිවීම නිසා විගණනයේදි ඒවා සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරිමට නොහැකි විය.

**(ii)** මූල්‍ය ප්‍රකාශනවල වල රු.5,177,568 ක අසාමාන්‍ය හර ශේෂයක් සහ රු. 190,889 ක අසාමාන්‍ය බැර ශේෂයක නිරවද්‍යතාවය තහවුරු කිරීම සඳහා ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවිය.

**2.** මූල්‍ය සමාලෝචනය

----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.109,999,705 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි ආදායම රු. 78,435,100 ක් විය.

2.2 බැංකු ගිණුම්

-------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) අංක 098-01-002-3-**3913965** දරණ ගිණුමට අදාලව 2015 දෙසැම්බර් 31 දිනට සකස් කරන ලද බැංකු සැසඳුම් ප්‍රකාශයේ 2012 සහ 2013 වර්ෂයන්හි තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ රු.8,667ක චෙක්පත් 03 ක් විය.

(ආ) වර්ෂ ගණනාවක සිට පවතින රු.73,528 ක් වූ එකතු කිරීම් හා රු.20,578,530 ක් වූ අඩු කිරීම් ශේෂයන් තහවුරු කර ගැනීමකින් තොරව බැංකු සැසඳුම් ප්‍රකාශයට ගැලපීම් කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී බැංකු ගිණුම් 03 කට අදාලව බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර නොතිබුණි.

(ඈ) නිකුත් කල නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොවූ මාස 06 ඉක්ම වූ වටිනාකම රු.**222,201** ක් වූ චෙක්පත් 23 ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 396 (ඈ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

**සමාලෝචිත වර්ෂයට අදාලව සභාපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.**

| ආදායම් විෂයය | ජනවාරි 01 දිනට හිඟ ශේෂය | බිල් කිරීම | තථ්‍ය අයකර ගැනීම | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| වරිපනම් බදු | 81,035,995 | 69,769,866 | 71,574,400 | 75,979,925 |
| බලපත්‍ර ගාස්තු | 485,430 | 617,860 | 626,960 | 476,330 |
| කුලී | 7,119,965 | 9,330,600 | 6,177,252 | 10,273,310 |
| ව්‍යාපාර බදු | 231,080 | 1,065,581 | 1,177,811 | 118,850 |

### 2.3.2 වරිපනම් බදු

2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වූ කාල පරාසය තුළ අයවිය යුතු වරිපනම් බදු ශේෂය රු.35,240,812 සිට රු.69,968,038 දක්වා වැඩි වී තිබුණි.

2.3.3 **කඩ කුලී**

-----------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) කඩ කාමර 178 ක නීත්‍යානුකූල අයිතිය සභාව සතු බවට තහවුරු කිරීමට හිමිකම් ඔප්පු විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

(ආ) කාමර 17 ක් අතුරු බදු දී ඇති අවස්ථාවලදී බදුකරුවන්ගේ බදු බලපත්‍ර අවලංගු කර නැවත ටෙන්ඩර් නොකර 1980 දෙසැම්බර් 31 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ 1980/46 දරන චක්‍රලේඛයේ 7 වගන්තියේ විධිවිධානවලට පටහැනිව එම වෙළඳසැල් අතුරු බදුකරුවන්ට එනම් වර්තමාන භුක්තියේ සිටින තැනැත්තන් වෙතම පවරා දීමට සභාව විසින් ක්‍රියාකර තිබුණි.

(ඇ) වසර ගණනාවක් තිස්සේ රු.1**,335,813** ක කඩකුලී මුදලක් නොගෙවා ඇති වෙළඳසැල් වල කුලිකරුවන් 30 ක් සම්බන්ධයෙන් සභාව කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ඈ) 2015 වර්ෂය සඳහා මස් සහ මාළු වෙළඳසැල් කඩ කාමර 05 ක් බදු දී නොතිබීම නිසා සභාවට අහිමි වූ ආදායම පසුගිය වර්ෂයට සාපේක්ෂව දළ වශයෙන් රු.170,500 ක් විය.

3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-----------------------------

3.1.1 යන්ත්‍ර කුලී ගෙවීම

--------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) කොම්පෝස්ට් අංගනයේ කසල තල්ලු කිරීම සඳහා කුලී පදනම මත චේන් ඩෝසරයක් ලබා ගැනීම සඳහා රු.1,227,570 ක බිල්පත් ගෙවා තිබුණි. සභාව සහ සේවා සැපයුම්කරු අතර ඇතිකර ගෙන තිබූ අවබෝධතා ගිවිසුම අනුව යන්ත්‍රය හෝ එහි යම් කොටසක් අක්‍රීය වුවහොත් හැකි ඉක්මණින් අළුත්වැඩියා කළ යුතු අතර දෛනික කටයුතු සඳහා එවැනිම තත්වයේ කැටපිලර් යන්ත්‍රයක් සේවා සැපයුම්කරු විසින් සැපයීම යුතුව තිබුණද සපයා තිබූ යන්ත්‍රය නිරතුරුවම අක්‍රීයව තිබුණි.

(ආ) ධාරිතාව වැඩි යන්ත්‍රයකින් අඩු යන්ත්‍ර පැය ගණනක් සේවය ලබා ගැනීමෙන් පිරිවැය අවම කිරීම යන අරමුණ ඉටුවී නොමැති බව ඉදිරිපත් කළ බිල්පත් අනුව නිරීක්ෂණය වන අතර මේ දක්වා සභාව විසින් ගෙවා ඇති හා ගෙවීමට ඇති සියළු බිල්පත් වටිනාකම රු.12,974,620 ක් වන බැවින් නව චේන් ඩෝසරයක් මිලදී ගැනීම වඩා ලාභදායී බව විගණනයේදී නිරීක්ෂණය විය.

3.2 **කළමණාකරණ අකාර්යක්ෂමතා**

------------------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2015 ජුනි 30 දින ත්‍රී රෝද රථ 03 ක් රු.1,637,250 කට මිලදී ගෙන තිබූ අතර ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලද උපරිම සීමාව ඉක්මවා ත්‍රී රෝද රථ 03 මිලට ගැනීම සඳහා රු.137,250 ක වැඩිපුර වියදමක් සභා අරමුදලෙන් දරා තිබුණි. පළමු මිළ කියුම අනුව මිළදී ගැනීම සිදු නොකිරීම නිසා සමස්ථ ගනුදෙනුවෙන් රු.117,120 ක මුදලක් සභා අරමුදලට පාඩු වී තිබුණි.

(ආ) සභාවේ වාහන ලේඛණය යාවත් කාලීන නොවීම නිසා 2003 වර්ෂයට පෙර මිලදී ගත් එකතු වටිනාකම රු. 11,779,199 ක් වූ වාහන සම්බන්ධයෙන් තොරතුරු සහ සභාවේ වාහන වලට අදාල ධාවන සටහන් සහ මාසික සාරාංශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) 2015 දෙසැම්බර් 31 දිනට සභාවේ නාගරික සංවර්ධන අධිකාරිය බැංකු ගිණුමේ රු.1,950,704 ක් සභාවට අවශ්‍ය ව්‍යාපෘති ක්‍රියාත්මක නොකර වර්ෂ ගණනාවක සිට අක්‍රියව පැවතින.

(ඈ) දිගින් දිගටම පැවතෙන නොපියවූ අත්තිකාරම් ශේෂය රු. 3,715,414 ක් විය.

(ඉ) සමීක්ෂණයේදී හඳුනාගත් ඌනතා සහ අතිරික්තතා සම්බන්ධයෙන් දී ඇති නිර්දේශයන් පිළිබඳව ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 757 ප්‍රකාර ගණන් දීමේ නිලධාරියා විසින් කටයුතු කර නොතිබුණි.

(ඊ) සභාව සතු දේපළ 135 ක් සඳහා ඔප්පු හෝ පැවරුම් නියෝග ලබා ගෙන නොතිබුණි.

(උ) 2015 දෙසැම්බර් 31 දිනට ස්ථාන මාරු වී ගිය සේවකයන් 8 දෙනෙකුගෙන් අයවිය යුතු ණය ශේෂය රු. 869,135 ක් ද, සේවය හැරගිය සේවකයින් 3 දෙනෙකුගේ ණය ශේෂය රු. 44,800 ක් ද, සේවය අත්හිටවූ සේවකයින් 3 දෙනෙකුගේ ණය ශේෂය රු. 408,120 ක් ද විය.

3.3 **කොන්ත්‍රාත් පාලනය**

-----------------------

(අ) පළාත් සභා, පළාත් නිශ්චිත හා දින 100 විශේෂ සංවර්ධන වැඩ සටහන යටතේ ව්‍යාපෘති 38 ක් අනුමත වී තිබූ අතර ඉන් පළාත් නිශ්චිත යටතේ ලැබී ඇති එක් ව්‍යාපෘතියක් අත්හැර දමා තිබූ අතර දින 100 වැඩ සටහන යටතේ ව්‍යාපෘති 06 ක වැඩ අවසන් කර නොතිබුණි.

4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

----------------------------------------

(අ) ක්‍රියාකාරී සැලැස්ම

---------------------

සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සහ ප්‍රසම්පාදන සැලැස්මක් පිලියෙල කර නොතිබුණි.

(ආ) අභ්‍යන්තර විගණනය
------------------------

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 134 (1), (2) හා (3) හි දැක්වෙන පරිදි අභ්‍යන්තර විගණන වැඩසටහන් විගණකාධිපතිගේ එකඟතාවය ඇතිව සකස් කල යුතු අතර, අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවද සභාව යොමුගත විධිවිධාන වලට අනුකූලව කටයුතු කර නොතිබුණි.

(ඇ) 2003 ජුනි 03 දිනැති අංක **PED/12** දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව සමාලෝචිත වර්ෂය තුල විගණන හා කළමනාකරණ කමිටු පවත්වා නොතිබුණි.

5 පද්ධති හා පාලන
--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) අභ්‍යන්තර විගණනය
(ආ) ගිණුම්කරණය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වත්කම් කළමනාකරණය